බන්ධනාගාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ :-21/2017

මගේ අංකය :- බ12/08/වා.භා.ස/2017
බන්ධනාගාර මූලස්ථානය,
2017-11-10.

සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීන්,සහකාර බන්ධනාගාර අධිකාරීන්.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ - 2017 වර්ෂය**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේඅංක PFD/RED/03/03/01 හා 2016.03.31 දිනැති රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 පරිදි වාර්ෂික ගබඩා භාණ්ඩ සමීක්ෂණය පහත පරිදි නිම කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.තව ද මු.රෙ.128 (1) (ඉ) වගන්තිය අනුව රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල් , බඩු බාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව පවත්වාගැනීම හා සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් හා විධිමත් විධිවිධාන යොදනු ලබන බවට හා ඒවා වරින් වර සත්‍යාපනය කරණු ලබන බවටත් ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරණු ලබන කල් හි එසේ නිෂ්කාෂණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස් වලට අනුකූලව කරණු ලබන බවටත් සෑහීමකට පත් විය යුතුය.එසේම මු.රෙ.128 (1) (ඉ) වගන්තිය අනුව භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින තොරතුරු ප්‍රකාශ හා සමීක්ෂණ වාර්තා නිවැරදිව හා කලට වේලාවට ඉදිරිපත් කළ යුතුය.

1. 2018.03.15 දිනට පෙර භෞතිකව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීම.
2. 2018.03.31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණය අවසන්කර වාර්තාවමූලස්ථානය වෙත ඉදිරිපත් කිරීම .
3. 2018.04.15 දිනට පෙර සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්ත සසදා වාර්තා කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
4. 2018.04.30 දිනට පෙර පොදු 47 වාර්තාවට අනුව විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම,අළුත්වැඩියා කළයුතු භාණ්ඩ අළුත්වැඩියාව, වෙන්දේසි කළයුතු භාණ්ඩ වෙන්දේසිකිරීම හා වෙනත් රජයේ ආයතනවලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර අවසන්කිරීම.
5. 2018.06.15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
6. අපහරණය කරණ ලද වත්කම් පිළිබද තොරතුරු, 2006.07.30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 422හි ඇමුණුම් ප්‍රකාරවලේඛණගතකර 2017-12-31 දිනට පවතින වත්කම් පිළිබද වාර්තාව සමීක්ෂණ වාර්තා සමගරාජ්‍ය මුදල් අධ්‍යකෂ ජනරාල් වෙත වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

ඉහත කාලසටහන අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර අවසන් කිරීම වෙනුවෙන් එම කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති ලිපි, චක්‍රලේඛ හා උපදෙස් පිළිබදව ද දැඩි අවධානය යොමු කරණ මෙන් කාරුණිකව දන්වමි.( මෙම චක්‍රලේඛය සමග පහත චක්‍රලේඛයන් ද දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය).

- බන්ධනාගාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ - අංක 26 / 2016 - 2016-10-25
- බන්ධනාගාර,ප්‍රතිසංස්කරණ,පුනරුත්තාපන,නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ අංක MPRRH/06/06/01/09 දරණ ලිපිය. -2016.07.07
- බන්ධනාගාර,ප්‍රතිසංස්කරණ,පුනරුත්තාපන,නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ අංක S/1/001 දරණ ලිපිය. - 2017.08.16

- රාජ්‍ය මුදල් චක්‍රලේඛ - අංකපීඑෆ්/439 - 2009-07-21
- රාජ්‍ය මුදල් චක්‍රලේඛ - අංක 422 - 2006-07-30

- තොග භාණ්ඩ සම්බන්ධයෙන් කපා හැරීම හා ඉවත් කිරීමට ඉදිරිපත් කිරීමට පෙර මු.රෙ.101 සිට 109 දක්වා විධිවිධාන අනුගමනය කර තිබිය යුතුය.

තව ද ,

- 2017 වසර අවසන් වන තුරු නොසිට අදාල ආකෘතිපත්‍ර ලබාගෙන නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී නිම කළ හැකි සියළුම කටයුතු නිම කිරීමට අදාල උපදෙස් ලබාදෙන්න.සාමාන්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අමතරව කාර්මික හා කෘෂිකාර්මික අත්තිතාරම් ගිණුමට අදාලව භාණ්ඩ සමීක්ෂණයේදී ද භාණ්ඩාගාර 66 ආකෘතියේ සම්පූර්ණ කර තිබිය යුතුවේ. තව ද සුභසාධක ගිණුමට අදාලව ආකෘති වෙනම සකස් කළ යුතුවේ.
- පිටපත් 05 කින් සකස් කරණ ලද භාණ්ඩාගාර 66 ආකෘතිපත් වලින් එක් පිටපතක් බන්ධනාගාර කොමසාරිස්(මුදල්) වෙත 2018-01-05 වැනි දිනට පෙර යොමු කළ යුතු වේ.
- මෙ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ යුතු ආකාරය දැක්වෙන,බන්ධනාගාරකොමසාරිස්(මුදල්) වෙතින් ලබාදෙනු ලබන අමතර ලිඛිත උපදෙස් අවශ්‍ය අවස්ථාවන් හිදී අදාල නිලධාරීන්ට ලබාදීමට කටයුතු කළ යුතු වේ.

එම්.වෙනුර ගුණවර්ධන,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය.

පිටපත්:- 01. විගණකාධිපති - දැ.ග.ස.
02. රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් - දැ.ග.ස.

03(1)


බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා
හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும்
இந்துமத அலுவலகள் அமைச்சு

**Ministry of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs**

අංක 356 B, ගාලු පාර, කොළඹ 03. இல. 356 B, காலி வீதி, கொழும்பு 03. No. 356 B, Galle Road, Colombo 03.


මගේ අංකය / எனது இல / My No. S/1/001

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 16 /08/2017

20 AUG 2017

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ-09.

<u>නැවත පිරවිය හැකි ටයර් ලබාගැනීම පිණිස.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් 2017.07.04 වන දින මාවනැල්ල ඩිපෝ කළමණාකරතුමා විසින් මා අමතන ලිපිය හා බැඳේ.

බන්ධනාගාර දෙපාර්තුමේන්තුවයට අයත් වාහන වලින් ඉවත් කරන ලද ටයර් ලබාදීමෙ නීත්‍යානුකූල ක්‍රමවේදයක් ඇත්නම්, එම නීත්‍යානුකූල ක්‍රමවේදය අනුගමනය කරමින් ටයර් ලබාදීම සහා අවශ්‍ය පියවර ගන්නා මෙන් දන්වා සිටිමි.

ඉංජි. පී.සුරේෂ්
ලේකම්

පිටපත :-
- ඩිපෝ කළමනාකාරතුමා - මාවනැල්ල ඩිපෝව.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister | 011-2395109 | ලේකම් / செயலாளர் / Secretary | 011-2395513 | අතිරේක ලේකම් / மேலதிக செயலாளர் / Additional Secretary | 011-2575326 | ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / General Office | 011-2395522 |
| ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2395105 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2395517 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2574056 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2574073 |
| | | E-mail smrrha@sltnet.lk | | E-mail addlsec@resettlementmin.gov.lk | | E-mail info@resettlementmin.gov.lk | |